**මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**<u>මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ, විධායක සේවා ගණයේ රසඥ තනතුරෙහි පවතින පුරප්පාඩුව සඳහා වසරක කාල සීමාවකට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා අයැදුම්පත් කැඳවීම - 2024</u>**

මහනුවර මහා නගර සභාවේ විධායක සේවා ගණයේ රසඥ තනතුරේ පවතින පුරප්පාඩුව සඳහා කොන්ත්‍රාත් පදනම මත සුදුසු නිලධාරියෙකු බඳවා ගැනීමට 2023.12.31 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරාලන ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයෙන්ම අයැදුම්පත් කැඳවනු ලැබේ.

**01. සුදුසුකම් -**

**1.1. පොදු සුදුසුකම්**

1.1.1. අයැදුම්කරු/ අයැදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

1.1.2. අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයෙන් වූ වසර 03 ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

1.1.3. අයැදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

1.1.4. සෑම අයැදුම්කරුවකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

1.1.5. 2023.12.31 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි අයකු විය යුතුය. (ඒ අනුව 2002.12.31 දිනට හෝ ඊට පෙර, 1988.12.31 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයැදුම් කිරීමට සුදුසුකම් ඇත.)

**1.2. අධ්‍යාපන සුදුසුකම් -**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින්,

(අ) රසායන විද්‍යාව සහිතව විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම

හෝ

(ආ) රසායන විද්‍යාව සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

හෝ

(ඇ) රසායන විද්‍යාව සහිතව විද්‍යාවේදී පශ්චාත් උපාධිය ලබා තිබීම

සටහන : ඉහත උපාධිය හෝ අනෙකුත් සුදුසුකම් 2023.12.31 දිනට හෝ ඊට පෙර දිනක සපුරා තිබිය යුතුය.

**02. දීමනා ගෙවීම -**

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව SL -01 – 2016 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වන : රු. 47,615/- ක් වන මූලික වැටුප පත්වීම ක්‍රියාත්මක වන දින සිට ගෙවනු ලැබේ.

මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද ඔබට හිමිවේ.

**03. සේවා කොන්දේසි -**

3.1. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලටද, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2023.05.30 දිනෙන් අනුමත කර ඇති මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ මහනුවර මහ නගර සභාවේ විධායක සේවා ගණයේ රසඳු තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි දක්වා ඇති නියමයන් හා කොන්දේසි වලටද, එම පරිපාටියෙහි කර ඇති හා මින්මතු සිදුකෙරෙන සංශෝධනයන් සඳහා යටත් වනු ඇත.

3.2 වසරක කාල සීමාවක් සඳහා පමණක් මෙම කොන්ත්‍රාත් කාලය වලංගු වන අතර, අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී මෙම කොන්ත්‍රාත් පදනමින් ලබා දෙන්නා වූ පත්වීම අහෝසි කිරීම සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

**04. බඳවා ගැනීමේ ක්‍රමය -**

4.1 අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලැබ ඇති ලකුණු පරිපාටියකට අනුව ලකුණු පිරිනමා, ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ.
(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

සටහන: සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයැදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

**05. අයදුම් කිරීමේ ක්‍රමය.**

- විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයැදුම්පත්, “ **ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර** ” යන ලිපිනයට 2024.05.03 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- අයැදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ **“මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ, රසඳු තනතුරෙහි පවතින පුරප්පාඩුව සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම ”** යනුවෙන් සඳහන් කළ යුතුය.

- නියමිත දිනට පසු ලැබෙන අයැදුම්පත් , අසම්පූර්ණ අයැදුම්පත් හා අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයැදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- අයැදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ.
(ආදර්ශ අයැදුම්පත්‍රයක් www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය)

**06.** සියළුම අයැදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර බඳවා ගැනීමේ නිවේදනය හොඳින් කියවා බලා තේරුම්ගත යුතුය.

**07.** මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති සියළුම කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

**08.** මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇති වුහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

2024 අප්‍රේල් මස 04 වෙනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.